අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

12 ශ්‍රේණිය 1 වාරය - සිංහල

පුරාතන ගද්‍ය සංග්‍රහය අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව

- පුරාතන ගද්‍ය ඇසුරින් සපයන පිළිතුරු සඳහා සමස්ත ප්‍රශ්න පත්‍රයෙන් ලකුණු 58% ක් ලබා ගත හැකිවීම.
- කතා සාරය ස්ථාවර ලෙස ගොඩනගා ගැනීමට 5 වරක්වත් අවබෝධයෙන් කියවීම
- දුරවබෝධ වචන තෝරා ගැනීම හා අර්ථ හා පද නිරුක්ති අධ්‍යයනය
- නැවත දෙවරක් අදාළ කතා හා කතා වස්තු අර්ථ හා නිරුක්ති අවබෝධයෙන් කියවීම
- චරිත පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම
- කතාවේ පරමාර්ථ හා චරිත අරමුණු හඳුනා ගැනීම
- කතාව තුළ ඉස්මතු වන කලාත්මක සාහිත්‍යමය ගුණාංග හා කථා වින්‍යාසය හඳුනා ගැනීම
    i. භාෂාව - ගැමි, සරල , විදග්ධ
    ii. ප්‍රකාශන ශෛලීන් - කතන්දර, බණ කතා, සංවාද, නාට්‍යානුසාරී
    iii. අලංකාර - අතිශයෝක්ති, උපමා, අනුප්‍රාස, රූපක, උත්ප්‍රාස, පරිසර වර්ණනා
    iv. රස උත්පාදනය - අද්භූත රස ඇතුළු නව නළු රස
- වර්තමානයට මෙම අත්දැකීම් කොතෙක් දුරට වලංගුදැයි විමසීම (සර්ව කාලීන වලංගුතාව)
- කතා මගින් හෙළි කරන ජීවන දෘෂ්ටිය
    - චිරන්තන ජීවන දෘෂ්ටිය
    - නව්‍ය ජීවන දෘෂ්ටිය
    - දෘෂ්‍යමාන ජීවන දෘෂ්ටිය
    - මනඃකල්පිත ජීවන දෘෂ්ටිය
    - යති ජීවන දෘෂ්ටිය(බමුණු දෘෂ්ටිය)

ලිහිල් බසින් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- දී ඇති ඡේදය ඉතා අවධානයෙන් කියවීම.
- අසා ඇති ප්‍රශ්නය කියවා නැවත ඡේදය කියවීම හා පිළිතුරු යටින් සලකුණු කර ගැනීම.
- ඔබේ පිළිතුරු වර්තමාන ලේඛන ව්‍යවහාරයට පෙරළා ගැනීම
  එහි දී ව්‍යාකරණානුකූල ව වාක්‍යය ගොඩනගා ගැනීම.
- විවරණ සැපයීමේ දී පදයෙහි අර්ථය නිරවුල් ව පැහැදිලි කර දැක්වීම කළ යුතු ය. පදාර්ථයට වඩා යමක් විස්තර කළ යුතු ය.
  (උදාහරණ - පලතුරක පිටපොත්ත අයින් කර මදය ලබාගන්නා සේ)

- පද්‍යාන්හි දී, පද පිළිවෙළ ගොඩනගා ගැනීම මූලික ව සිදු කර ගන්න. (පද අන්වය ගොඩ නගාගන්න)

සිංහල සාහිත්‍ය යුග කෙටියෙන්

- පොළොන්නරු යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා ම බුදුගුණ විවරණය කරන බණ කතා පොත් රාශියක් මෙරට ගිහි - පැවිදි උගතුන් බිහිකළ බව
- ඒ අනුව අමාවතුර, ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, දම්සරණ , සඟසරණ යන ගද්‍ය ග්‍රන්ථ පොළොන්නරු යුගයේ ප්‍රකාශ විණි.

අමාවතුර

පරිච්ඡේද 18 කි. පුරිසදම්ම සාරථී බුදුගුණය පාදක විය. "නොවියත් හුදී ජනයන් සඳහා සිය බසින් මා විසින් සැකෙවින් දක්වනු ලැබේ."

බුත්සරණ

පුරිසදම්ම සාරථී බුදුගුණය පාදක වේ. විද්‍යාචක්‍රවර්තීන් විසින් විරචිත ය.

සද්ධර්මරත්නාවලිය

බුද්ධක නිකායට අයත් ධම්මපද ගාථා මූලාශ්‍ර කොට ගෙන බුද්ධඝෝෂ හිමි නිර්මාණය කළ ධම්මපදට්ඨ කතා නම් කෘතිය ඇසුරින් ධර්මසේන හිමියන්ගේ පන්හිඳින් ප්‍රතිනිර්මිත වූ සද්ධර්මරත්නාවලිය "පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලංඝණාදි වූ අඩු වැඩි ඇතත් එය නොසලකා...." යනුවෙන් උන් වහන්සේ විසින් ම සපයන විවරණය ප්‍රකාර ව

එහි ස්වතන්ත්‍රතාව විනිශ්චය කළ යුතු වේ.

පූජාවලිය

මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර ස්ථවිරයන් විසින් රචිත ය. බුදුරදුන්ගේ අරහං ගුණය අන්තර්ගත ය.

පන්සිය පනස් ජාතක කතාපොත

කුරුණෑගල යුගයේ දී කර්තෘ මණ්ඩලයක් විසින් පාලි ජාතකට්ඨ කතාව ඇසුරින් සම්පාදිත වේ.බෝසත් චරිතයක් සෑම කථාවක ම පැවතීම හේතුවෙන් මෙය ජාතක කථා යනුවෙන් හැඳින් වේ. එසේ ම බෞද්ධයන් අතර **'ජාතක කතා පොත් වහන්සේ'** යන ගෞරව නාමයෙන් පිදුම් ලැබෙන ග්‍රන්ථ රත්නය ද මෙයයි.

සද්ධර්මාලංකාරය

පාලි රසවාහිණිය පාදක කොට ගෙන දෙවන ධර්මකීර්ති සංඝරාජ හිමියන් විසින් රචනා කරන ලද අතර මෙහි කතාවස්තු විකාශනය ලාංකේය හා දඹදිව සමාජ - පසුබිම්හි ප්‍රතිෂ්ඨාපිත ව පවතී.

සද්ධර්මරත්නාකරය

පලාබද්දල (පළාබත්ගල) වනවාසී ධම්මදින්නාචාර්ය විමලකිත්ති

සිද්ධාර්ථ තෙරුන් විසින් රචිත ය.

සාරාර්ථ සංග්‍රහය	මහනුවර යුගයේ දී බුදුගුණ විවරණය කරමින් වැලිවිට ශ්‍රී සංඝරාජ මාහිමි රචනා කරන ලද්දකි.
ශ්‍රී සද්ධර්මාවාද සංග්‍රහය	බුදුරදුන්ගේ සත්‍යා ගුණය පාදක කොට ගෙන තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත තෙරුන් විසින් රචිත ය.

- පුරාතන සිංහල ගද්‍ය සාහිත්‍යය විමසුම් කිරීමේ දී විවිධ ශාස්ත්‍රීය ස්වරූපයෙන් යුත් යුග දහයක් පමණ හමුවේ. ඒ මෙසේ ය.

1. අනුරාධපුර යුගය
2. පොළොන්නරු යුගය
3. දඹදෙණි යුගය
4. කුරුණෑගල යුගය
5. ගම්පොල යුගය
6. කෝට්ටේ යුගය
7. සීතාවක යුගය
8. සෙංකඩගල යුගය (මහනුවර යුගය)
9. මාතර යුගය
10. කොළඹ යුගය වශයෙනි.

මෙකී යුග අතරත අර්ධ ශතවර්ෂයක් පමණ වන කුරුණෑගල යුගය මධ්‍යතන අවධියට අයත් යැයි සැලකෙයි. සිංහල සාහිත්‍යයේ උසස් දියුණුවක් ලද මෙම යුගයේදී සිංහල සාහිත්‍යයට නවාංග රසක් ද එක් වී ඇත. මෙකල සාහිත්‍යය පෝෂණය උදෙසා ග්‍රන්ථ රාශියක් බිහි වූයේ ද ඒ නිසා ම ය. විවිධාකාර ගද්‍ය කෘති බිහි වූ අතර ඉතා සුවිශාලතම ග්‍රන්ථය වූ “පන්සිය පනස් ජාතක කතා පොත” බිහි වූයේ ද මෙම අවධියේ දී බැව් සැලකිය යුතු ය. තව ද මේ අවධිය තුළ දී බිහි වූ ගද්‍ය කෘති පිළිබඳ දිගු විස්තරයක් අවශ්‍ය නොවෙතත් එය සංක්ෂිප්ත ව මෙලෙස දැක්විය හැකි ය.

කුරුණෑගල යුගයේ සාහිත්‍යය කෘති

කෘතිය	කර්තෘ	මූලාශ්‍ර	තේමාව/අන්තර්ගතය
පන්සිය පනස් ජාතක පොත	කර්තෘ මණ්ඩලයක්	පාලි ජාතකට්ඨකථාව	බුදුන්ගේ පූර්ව ජන්ම පිළිබඳ කතා ඇතුළත් බණ කතා
උම්මග්ග ජාතකය	වීරසිංහ පතිරාජ	පාලි ජාතකට්ඨ කතා	ප්‍රඥා පාරමිතා අගය මහාඖෂධ පඬිතුමාගේ වීර චරිතාපදානය

සිංහල බෝධි වංශය (පරිච්ඡේද 12)	විල්ගම්මුල හිමි	පාලි මහා බෝධි වංශය	ශ්‍රී මහා බෝධිය පිළිබඳ වංශ කතා
සිංහල අනාගත වංශය (මෙතේ බුදු සිරිත)	විල්ගම්මුල හිමි	සමන්ත පාසාදිකා අනාගතවංශ පාලි කෘති	මෛත්‍රී බෝධිසත්වයන්ගේ චරිතාපදානය
සඳකිඳුරු දා කව (සිව් පද 434)	විල්ගම්මුල හිමි	සඳ කිඳුරු ජාතකය	බුදුන්ගේ පෙර අත් භවයෙහි සඳ යෝනියේ උපත ලබා සිදු වූ පුවත
දඹදෙණි අස්න	කර්තෘ අඥාතය	-	දඹදෙණි රාජධානි පුවත හා පරාක්‍රමබාහු රාජ වර්ණනා
දළදා සිරිත (පරිච්ඡේද 7)	දෙව් රද දම් පසඟිනාවන්	පාලි දාඨාවංශය	දළදාව පිළිබඳ පැවැත්විය යුතු චාරිත්‍ර
දළදා පූජාවලිය	කර්තෘ අඥාතය	පාලි දාඨාවංශය හා වංශ කතා	දළදා පූජා විධි

පන්සිය පනස් ජාතක පොත

බුදුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අංග නවයකින් සමන්විත වේ. එනිසා එයට නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය යැයි කියනු ලැබේ. නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය නම්,

1. සුත්ත
2. ගෙය්‍ය
3. වෙය්‍යාකරණ
4. ගාථා
5. උදාන
6. ඉතිවුත්තක
7. ජාතක
8. අබ්භූතධම්ම
9. වේදල්ල වශයෙනි.

මෙයින් සත්වන අංකය තුළ ජාතක කථා ඇතුළත් ය. කෙසේ වෙතත් බෞද්ධ සාහිත්‍යයේ එන විශාලත ම කෘතිය පන්සිය පනස් ජාතක පොත ය. අතීතයේ ලියැවුණු පාලි ජාතකට්ඨ කථාව නැමැති අටුවා ග්‍රන්ථය හා සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් කොටසක් වන ජාතක ගාථා පාලිය මෙහි විස්තර කොට ඇත.

"ජාතං භූතං පුරාවෘත්තං

භගවතෝ පුබ්බ චරිතං

ඛ්‍යාති කථෙතී ජාතකං"

පෙර විසූ කඳ පිළිවෙළ හෙවත් බුදුන්ගේ පෙර ආත්ම භාවයේ කතා පුවත් මෙහි ඇතුළත් ය. උපදේශ කෘතියක් ලෙස සැලකෙන ජාතක පොත සිංහලට පරිවර්තනය කර ඇත්තේ කුරුණෑගල යුගයේ දී ය. එය හතර වන පැරකුම්බා රජ දවස ශාසනික සේවයක්

ලෙස වීරසිංහ ප්‍රතිරාජ ඇමැතිගේ මූලිකත්වයෙන් සිංහලයට පරිවර්තනය කර ඇත. එකී තතු සිංහල ජාතක පොත ආරම්භයෙහි ම එන පහත පාඨයෙන් විශද වේ.

"පන්සිය පනස් ජාතක ධර්මය එළුවෙන් දක්වන්නට වුව මැනවයි කියා පරාක්‍රම නම් සත්පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යෝත්තමයාගේ උත්සාහයෙන් ද අටුවා සාමීන් ලී ජාතක නියාව නොවරදවා එළුවෙන් ලියූ ජාතක කතාව සත්පුරුෂ වූ මනුෂ්‍යයන් විසින් කන් යොමා සිත් එළා ඇසිය යුතු"

මෙසේ වූ ජාතක පොතේ කතා ගණන 547 කි. උච්චාරණයේ පහසුව සඳහා පන්සිය පනස් ජාතක පොත නමින් හඳුන්වනු ලැබේ. ගැමියා මෙය "ජාතක පොත් වහන්සේ" යන පූජනීය නාමයෙන් හඳුන්වනු ලැබේ.

මෙම කෘතියේ එන කතාන්දර අතීත දඹදිව විසූ මිනිසුන් විසින් බුදුන් කෙරේ පැවැති අතිශය භක්තිය නිසා නිර්මාණාත්මක ව රචනා කොට ඇත. ඒවායේ සාහිත්‍යමය අගය සේ ම ධර්මෝපදේශයන් ද ඇතුළත්ය. භාරතීය හින්දු බැතිමතුන්ගේ භගවත් ගීතාව, කතෝලිකයින්ට බයිබලය, ඉස්ලාම් බැතිමතුන්ට අල්-කුරාණය, වෙන් වෙන් වශයෙන් වැදගත් වන්නා සේ ම ශ්‍රී ලාංකික බෞද්ධයන්ට වැදගත් වන්නේ පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ය. එය බෞද්ධයාගේ අත්පොතක් බඳු වන්නේ ය. එය අපූර්ව ආකාරයට මිනිසුන්ගේ මනෝභාවය විග්‍රහ කරන්නකි.

මෙහි දී තරම් මිනිස් සිතේ ගූඪත්වය විවරණය කරන වෙනත් කෘතියක් නොමැති තරම් ය. දැහැමි සමාජයකට යන ගමන් මග පෙන්වමින් මිනිසාට ජීවිතයේ ලබන අත්දැකීම් තුළින් නව සමාජ ජීවිතයක් කරා ගමන් කිරීමට අවශ්‍ය උපදෙස් දීම ද ජාතක කතාකරු සිදුකරයි. මිනිස් සිතේ සුබ පක්ෂය මෙන් ම දුක්ඛ පක්ෂය ද නිරූපණය කිරීමේ දී එය සිත් ගන්නා අන්දමින් ඉදිරිපත් කිරීමට ජාතක කතාකරු සමත් වී ඇත. මිනිස් සමාජයේ ක්‍රියාකාරීත්වය සිය කතාවලින් ඉදිරිපත් කිරීමේ දී ඔහු දක්වා ඇති අපූර්ව කුසලතාවය ද ජාතක කතාවල සදාතනික අගයට හේතු වී ඇත.

ජාතක කතාකරු කිසිකලෙකත් පැරණි නොවන සර්වකාලීන අගයකින් හා වලංගුතාවකින් යුක්ත ව ශ්‍රව්‍ය ගෝචර රටාවකින් සිය කතා ගොඩනගා තිබීම ද විශේෂත්වයකි. එහි එන සියලු ම ජීවන ප්‍රවෘත්ති අද්‍යතන සමාජයට ද උචිත ම ය. අනාගතයටත් එසේ ම ය. ගෘහ ජීවිතයේ සකල විධ පාර්ශවයන් ද ගුප්ත මිනිස් සිතේ සකල විධ ස්වරූපයන් ද හෙළි කරන ජාතක කතා මිනිස් සිතේ ස්වභාවයන්හි කිඳා බැස එහි ස්වරූපය හෙළි කරන්නට සමත් ය. ඒ ඒ චරිත තුළ ඇති ගුණ අගුණ මැනවින් වටහාගෙන විවරණය කිරීමට සමත් ය.

ස්ත්‍රී පුරුෂ ගුණ හා දුර්ගුණ හෙළි කරමින් ඒ ඒ චරිතයන්ගේ පවත්නා වූ සැබෑ තත්ත්වය ඉදිරිපත් කරමින් සමාජ ශෝධනයකට මාර්ගය පාදා දීම ද ජාතක කතාකරුගේ මුඛ්‍ය පරමාර්ථය වූ බැව් පැහැදිලි ය. පුද්ගලයාට සදුපදේශ සපයා දුගතිගාමීත්වයෙන් මුදවා සුගතිගාමීත්වයට යොමුකර සුචරිතවත් සමාජයක් නිර්මාණය කිරීමේ පුරෝගාමීත්වය ජාතක කතා තුළින් සිදුවේ.

ජාතක කතා විමසුම් කිරීමේ දී ඒවා සම්බුද්ධ දේශනාවන් ම ඇසුරුකොට නිර්මාණය වූ සාහිත්‍යාත්මක නිර්මාණ විශේෂයක් බව පැහැදිලි වේ. එහෙත් මේවා බුදුන් වහන්සේගේ දේශනා ම යැයි වටහා නොගත යුතු ය. එසේ වුවත් මේවා පාඨකයා හට ඉදිරිපත් වන්නේ සම්බුද්ධ භාෂිතයන් ම ලෙසිනි. එබැවින් පාඨකයාට එහි රසය හරය දැනෙනුයේ බුදුන් වහන්සේගේ දේශනාවක් ලෙසින් ම ය. කතා රසය තීව්‍ර වනුයේ ඒ නිසා ය. සෑම ජාතක කතාවකට ම පොදු වූ ආකෘතියක් ද වේ. ඒ මෙසේ ය.

1. වර්තමාන කතාව
2. අතීත කතාව
3. සමෝධානය

    සැ.යු: ඇතැම් ජාතක කතා තුළ අතුරු කථා ගාථා ධර්ම හා වෛයාකරණ (ව්‍යාඛ්‍යාන) යන ආකෘතික අංග ද දැකිය හැකි ය.

    කුරුණෑගල යුගයේ රචිත හෙයින් පන්සිය පනස් ජාතක පොතෙහි අපට හමුවන්නේ කුරුණෑගල යුගයේ භාෂාව හා සංස්කෘතිය බව ද වටහා ගත යුතු ය.

සිංහල බණකථා සාහිත්‍යයේ ආරම්භය හා ව්‍යාප්තිය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

- "ධර්ම ප්‍රකරණ" බණ කථා නමින් ප්‍රකට ය.
- භාණක, භාණ යන පාලි වචනයෙන් බණ යන වදන සිංහලයට එක් ව ඇත.
- ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්ගේ 'පැරණි ලක්දිව ඉතිහාසය' නම් කෘතියේ බුදුන් ජීවමාන කාලයේ ම ජාතක භාණක භික්ෂුවක් පිළිබඳ ව පපඤ්ච සූදනියේ සඳහන් බව දක්වා ඇත.
- ජාතක භාණක භික්ෂූන් පිළිබඳ ව මහා වංශයේ ද සඳහන් ය.
- අනුරපුර යුගයේ 1 සියවස විසූ ඉලනාග රජු තුලාධාර විහාරවාසී මහා පදුම නම් ජාතක භාණක ස්ථවිරයන් වහන්සේගෙන් මහා කපි ජාතකය ශ්‍රවණය කළ බව මහාවංශයේ දැක් වේ.
- භාරතයේ භාරුත් ස්ථූපයෙහි සහ තොරණවල ජාතක කතා නිරූපිත කැටයම් ද අජන්තා බිතුසිතුවම්හි ද, නාලන්දාවේ පැරණි ස්තූපවල ද, භාරතීය ලෙන් විහාර ආශ්‍රිත ව ද ජාතක කතා නිරූපිත ය.
- දුටුගැමුණු රජු මහා ස්තූපයේ ධාතු ගර්භයේ ජාතක කතා සිත්තම් කිරීම පිළිබඳ මහාවංශයේ සඳහන් වේ.
- චීන ජාතික ෆාහියන් භික්ෂුවගේ දේශාටන වාර්තාවේ ද ජාතක කතා පිළිබඳ ව ඇතුළත් ය. එයට අනුව අභයගිරියේ දළදා උත්සවයක දී ජාතක කතා 500 ක සිතුවම් වීදිය දෙපස තැබූ බැව් දැක්වේ.
- මහින්දාගමනයෙන් පසු ව්‍යාප්ත බුදුදහමේ ඇතුළත් ධර්ම "බණ" නමින් ජනයා අතර ප්‍රකට වීම.

- මහින්දාගමනයත් සමඟ බණ යන්න භාණක සම්ප්‍රදායන් විසින් වනපොත් කිරීමෙන් මෙරටට ගෙන එන ලදී.
- භාණක සම්ප්‍රදායන් අස්ථාවර වීමත් සමඟ මිහිඳු හිමි ඇතුළු පිරිස ලංකාවේ පැවිදි වූ භික්ෂූන් ලවා පාළි අටුවාව සිංහලයට නගා (හෙළටුවා) ලියන්නට ඇතැයි වියත් පිළිගැනීම ය.
- මුඛ පරම්පරාගත ත්‍රිපිටකය හා අට්ඨකථා ග්‍රන්ථාරූඪ කරන ලද්දේ වළගම්බා රාජ්‍ය සමයේ ය. ඒ මාතලේ අලුවිහාරයේ දී ය. මහතෙරුන් 500 කගේ සහභාගිත්වයෙනි. එහි දී මුළින් ම සිංහලෙන් ලියැවුණු අට්ඨකතාවන් කථාන්දර ස්වරූපයෙන් ලියන ලදැයි සැලකේ.

<u>පසු ඇගයීම</u>

(1) ජාතක කතා සිංහල බෞද්ධ සාහිත්‍යයෙහි වැදගත් තැනක් හිමි කර ගනී. මේ පිළිබඳ විමසීමක යෙදෙන්න.

සද්ධර්මරත්නාවලියේ සුවිශේෂ ලක්ෂණ

i. මූලාශ්‍රගත කරුණු ඇසුරුකොට ගත් ස්වාධීන කෘතියක් වීම.
ii. කතාව මෙරටට හා සමාජයට ගැළපෙන ලෙස ඉදිරිපත් කිරීම.
iii. කතාව ආරම්භයේ දී මූලික හරයාත්මක අරමුණු ඉදිරිපත් කිරීම.
iv. කතා කීම හා බණ දෙසීම එකට සිදු කිරීම.
v. කතාව තුළින් භාවයන් උද්දීපනය කිරීම.
vi. ස්වතන්ත්‍ර උපමා රූපක රැසක් භාවිත කිරීම.
vii. අවස්ථාවට අනුව කෙටි වැකි, දිගු හැකි, සංවාද, සංස්කෘත පාලි තත්සම වචන සිංහල සමඟ මිශ්‍ර කොට භාෂාව හැසිරවීම.
viii. පරිසරය ඇසුරෙන් අහුලා ගත් හා සහේතුක ව නිර්මාණය කළ උපමා (මාලෝපමා) රූපක භාවිතය
ix. කට වහර, ගැමි වහර හා පිරුළු ආදිය සුලභ ව භාවිත කිරීම
x. මිනිසා කෙරෙහි සානුකම්පිත දෘෂ්ටියක් ජනිත කිරීම
xi. සාහිත්‍යය හා ධර්ම රසය මතු කරමින් කතාව ඉදිරිපත් කිරීම
xii. කව්ලැකිය වඩා ලෙව්ලැකිය - ලෝක ව්‍යවහාර ශාස්ත්‍රීය ව්‍යවහාරය (චම්පු කාව්‍ය ලක්ෂණ)
xiii. නිර්මාණාත්මක ප්‍රබන්ධ ශෛලිය භාවිතයට ගැනීම (මට්ට කුණ්ඩලී කථා තේමාවේ නම් භාවිතය)
xiv. සෑම කතාවකට ම නිර්මාණාත්මක මාතෘකා හා පුද්ගල නාම යෙදීම

සද්ධර්මාලංකාරය

- සද්ධර්මාලංකාරය ගැන අවධානය යොමු කිරීමේ දී මෙම කෘතිය ලියවුණු යුගයේ සාහිත්‍ය පසුබිම සාහිත්‍යමය ලක්ෂණ ඇතුළත් කොටසක් රචනාමය ප්‍රශ්නයට ඇතුළත් විය හැකි ය.

ගම්පොළ යුගයේ සාහිත්‍යය හා ගම්පොළ රාජධානි සමය අඩ සියවසකි.

මෙය ගද්‍ය හා පද්‍ය කෘති බිහි වූ යුගයකි. මේ යුගයේ සිංහල සාහිත්‍යය වංශාවලියේ නම් ගත් විශ්ව කීර්තිමත් ධර්මකීර්ති පරපුරේ සාහිත්‍ය සේවය අති විශිෂ්ට ය. ශ්‍රී ජයබාහු ධර්මකීර්ති හිමිපාණන්ගේ

මාහැඟි බණ කථා සංග්‍රහය සද්ධර්මාලංකාරයයි. ශාසන ඉතිහාසය පිළිබඳ මෙතෙක් නොලියැවුණු ගණයේ අගනා ග්‍රන්ථයක් වන නිකාය සංග්‍රහය ද ජිනබෝධාවලී නමැති පාලි කාව්‍යය ද උන්වහන්සේගේ අගනා කෘති වේ.

මෙම යුගයේ රචිත ග්‍රන්ථ රැසක් ම හඳුනාගත හැකි ය. නිශ්චිත ව කවරෙකු විසින් රචනා වූවේ දැ'යි? කිව නොහැකි එළු අත්තනගලු වංශය පාලි හත්ථවනගල්ල විහාර වංශය ඇසුරින් රචිත ග්‍රන්ථයක් වේ. මේ හැර අවවාද, දාන හා ශීල යන පරිච්ඡේද තුනකින් සමන්විත සද්ධර්මාමෘත මංජුසාව හෙවත් පරිච්ඡේද පොත ද අගනා බණ කථා සංග්‍රහයකි. මෙම ග්‍රන්ථයෙහි කර්තෘ අවිනිශ්චිත ය.

ගම්පොළ රාජධානි සමයේ රචිත පාලි කෘති රැසක් ම හඳුනාගත හැකි ය. ගතාරා උපතපස්වීන් විසින් රචිත වුත්තමාලා සතකයත්, සීලවංස ධර්මකීර්ති හෙවත් ප්‍රථම ධර්මකීර්ති හිමිපාණන් විසින් රචිත පද්‍ය 105 කින් සමන්විත පාරමී මහා සතක කාව්‍යයත්, ජනානුරාග චරිත කාව්‍යයත්, සූවිසි විවරණ ප්‍රබන්ධයත් මෙම යුගයේ රචිත පාලි කෘති වේ.

සිව් පද ආකෘතියෙන් රචිත නවාංගයක් වන සංදේශ කාව්‍ය සිංහලයට එක් වූයේ ද මේ යුගයේ දී ය. සිංහල සන්දේශාවලියෙහි විද්‍යමාන සන්දේශ කෘති අතර මයුර හා තිසර සන්දේශ යන කෘති දෙක ම ගම්පොළ යුගයේ රචිත කෘති ය.

නිකාය සංග්‍රහය දෙවන ධර්මකීර්ති හිමියන්ගේ ප්‍රථම කෘතිය වශයෙන් පිළිගැනේ. මෙම කෘතියෙන් ශාසනික තොරතුරුත්, ලංකා ඉතිහාසය සම්බන්ධ තොරතුරුත්, මෙරට විසූ පඬි පරපුර ගැන තොරතුරුත් අනාවරණය වේ. මේ නිසා ශාසනික ඉතිහාසය, ලංකා ඉතිහාසය, සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ වැදගත් මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙස හැඳින්වේ.

පූජාවලිය

පූජාවලිය ග්‍රන්ථය පිළිබඳ මූලික හැඳින්වීම

ග්‍රන්ථ නාමය

"පූජා" යනු බුදුරදුන් වෙත කරන ලද ආමිස හා ප්‍රතිපත්ති පූජාවන් ය. 'ආවලිය' යනු පද්ධතිය හෙවත් වැල යන්නයි. ඒ අනුව බුදුන් වෙත කරන ලද පූජාවන් පද්ධතිය යන්න ග්‍රන්ථ නාමය විස්තර කළ විට ගත හැකි ය.

කර්තෘ : මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි

කාලය : 13 වන සියවස හෙවත් දඹදෙණිය යුගය

මූලාශ්‍ර

සද්ධර්මරත්නාවලිය, ජාතක කතා පොත, සද්ධර්මලංකාරය යන කෘති සඳහා නිශ්චිත මූලාශ්‍රයක් හඳුනා ගත හැකි වුව ද මේ සඳහා එසේ නම් කළ හැකි මූලාශ්‍රයක් නොමැත. මෙම කෘතිය ලියූ බුද්ධ පුත්‍ර හිමි ගොස් ඇත්තේ අමාවතුර බුත්සරණ යන කෘතිවල කතුවරුන් ගිය ගමන් මගෙහි ය. මේ මගින් බුදුන්ගේ අරහං ගුණය තුළ ඇති පූජාහාර්ය ගුණය (පිදීම් ලැබීමට සුදුසුය) විස්තර කරයි.

ග්‍රන්ථයේ අරමුණු

මෙම ග්‍රන්ථයේ අරමුණු කිහිපයක් ඇත. ඒවා බාහිර අරමුණු, අභ්‍යන්තර අරමුණු වශයෙන් කොටස් කළ හැකි ය.

- බාහිර අරමුණු

ද්විතීය පණ්ඩිත පරාක්‍රමබාහු මහ රජුගේ අමාත්‍යවර බුද්ධත්වාභිලාශී දේව පතිරාජයන් විසින් කරන ලද ආරාධනයයි. "බෝධිසත්ව පාරමිතාවෙන් යෙදුණා වූ බණක් වදාරන්නට...."

- අභ්‍යන්තර අරමුණු 3 කි.

1. ද්විතීය පණ්ඩිත පරාක්‍රමබාහු රජු බුදු බව පැතීමේ මාර්ගයට යොමු කිරීම.
   "අප රජ හට බෝධිසත්ව පාරමිතාවෙන් යෙදුණා වූ බණක් වදාළ මැනව..."
2. සිංහල භාෂාව දන්නවුන්ගේ ලෝකාර්ථ සිද්ධිය සෑදීම සඳහා
   "සිංහල භාෂාව දන්නා සත් පුරුෂයන්ට ලෝවැඩ පිණිස..."
3. කතුවරයාගේ බුදු බව පැතීමේ අරමුණ සාදා ගනු පිණිස
   "මාගේ ද අභිමානය ප්‍රාර්ථනාව සාදා ගන්නා පිණිස"

මෙකල මහායාන බුදු සමයේ එන බුද්ධත්වය පැතීමේ ක්‍රමවේදය ප්‍රචලිත ව පැවතෙන්නට ඇත. එම නිසා සෑම දෙනා ම බුද්ධත්වය පැතීමේ මාර්ගයට යොමු කිරීම සාමාන්‍ය දෙයකි.

අන්තර්ගතය

සුමේධ තාපස කතාවේ සිට බෝසත් ආත්මභාව ලැබීම, ඉපදීම, පිරිනිවීම දක්වා තොරතුරු ඇතුළත් ය. අවසන් පරිච්ඡේද දෙකේ ලක් බුදු සසුන පිළිබඳ තොරතුරු දක්වයි. මේ සියල්ල තුළින් ම බුදුරදුන්ට කරන ලද නානා පූජා විධි දක්වයි.

අ.පො.ස (උසස් පෙළ) විභාග සඳහා පූජාවලියේ කතා දෙකක් නියමිතය

1. අනුරුද්ධ කුමාර වස්තුව
2. ජීවක කතා වස්තුව

මෙම කථා වස්තු දෙකේ සාරය දැනගත යුතු ය.

<u>පසු පැවරුම්</u>

- **"විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ අවබෝධයක් ඇති ප්‍රාමාණික බුද්ධිමතෙකු ලෙස පූජාවලි කර්තෘවර බුද්ධ පුත්‍ර හිමි හැඳින්විය හැකි ය." නියමිත කතා දෙක ඇසුරෙන් කරුණු දක්වන්න.**

ග්‍රන්ථයට අදාළ මූලික විස්තරය කරන්න.

පිළිතුර සාර්ථක ව ගොඩනැගීම සඳහා පහත මගපෙන්වීමට අනුව විවිධ ක්ෂේත්‍රයන් දක්වන්න.

1. බෞද්ධ හිමිනමක් ලෙස බෞද්ධ දර්ශනය පිළිබඳ වූ දැනුම
2. සාහිත්‍යධරයෙකු ලෙස සාහිත්‍ය පිළිබඳ වූ දැනුම
3. වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වූ දැනුම
4. කෘෂිකර්මාන්තය පිළිබඳ වූ දැනුම
5. බෞද්ධ හිමිනමක් ලෙස බුද්ධ දර්ශනය පිළිබඳ වූ දැනුම

මෙහි දී කර්මය, පුනර්භවය පිළිබඳ කතුවරයා තුළ වූ දැනුම, සසරෙහි භයංකාර බව පිළිබඳ දැනුම ආදිය විස්තර කළ යුතු ය.

උපමා, රූපක, සංකේත, සංකල්පරූප, සංවාද, දිගු හා කෙටි වැකි ආදිය පරිහරණය කරමින් පූජාවලිය වැනි ශ්‍රේෂ්ඨ ධර්ම ග්‍රන්ථයක් රචනා කිරීම සාමාන්‍ය පුද්ගලයෙකුට කළ නොහැකි බව දක්වා පූජාවලි ග්‍රන්ථය ම එයට සාක්ෂි දරන බව පැහැදිලි කරන්න.

- වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වූ දැනුම

ජීවක චරිතය ඇසුරෙන් ජීවක ශිල්ප ලබා ගැනීම, ජීවක සුව කළ රෝග පිළිබඳ දක්වා කරුණු ඔප්පු කරන්න.

- කෘෂිකර්මාන්තය පිළිබඳ වූ දැනුම

මහනාම කුමරු උපයාගෙන කන අයුරු අනුරුද්ධ කුමරුට උගන්වයි. එහි දී කෘෂිකර්මාන්තය පිළිබඳ ගැඹුරු දැනුමක් කතුවරයා තුළ වූ බව පැහැදිලි වෙයි.

මෙම මගපෙන්වීම අනුව අවශ්‍ය උද්ධෘත දක්වා පිළිතුර ගොඩනගන්න.